කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு

MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT













# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## කාර්ය සාධන විශ්ලේෂණ වාර්තාව

සැලසුම් අංශය - 2025

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL)

ශ්‍රී ලංකාවේ මිනිරන් කැණීම් ලන්දේසි පාලන කාලයේ සිට සිදුවී ඇත. මිනිරන් වල පිරිසිදුම වර්ගය වන vein මිනිරන් (ලම්ප් ග්‍රැෆයිට්) නිෂ්පාදනය කරන ලෝකයේ එකම රට ශ්‍රී ලංකාව වන අතර දැනට ලෝක මිනිරන් නිෂ්පාදනයෙන් 1% කට වඩා අඩු ප්‍රමාණයක් වාණිජ ප්‍රමාණයෙන් නිෂ්පාදනය කරයි. ග්‍රැෆයිට් ( දේශීය වශයෙන් ප්ලම්බගෝ ලෙස හදුන්වන) පතල් දිවයිනේ වයඹ සහ නිරිතදිග ප්‍රදේශවල බහුලව පිහිටා තිබේ.

කහටගහ මිනිරන් පතල වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දොඩංගස්ලන්ද ප්‍රදේශයේ මදුරාගොඩ පිහිටා ඇති අතර එය කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් මඟින් කළමනාකරණය කරනු ලැබේ. එය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද පූර්ණ රාජ්‍ය සමාගමක් වන අතර එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතී.

කහටගහ පතලේ භූමි ප්‍රමාණය අක්කර 102ක් පමණ වේ.

### කහටගහ නිෂ්පාදනවල සුවිශේෂත්වය

ඉහළ කාබන් ප්‍රතිශතයක් සහිත ස්වභාවික ස්ඵටිකරූපී ඉල්ලම් මිනිරන් වාණිජ මට්ටමෙන් සපයන ලෝකයේ එකම රට ශ්‍රී ලංකාව වන අතර විශේෂයෙන්ම කහටගහ පතල සම්පූර්ණයෙන්ම ස්ඵටිකීකරණය වූ කාබන් 99% කට වඩා වැඩි ප්‍රතිභතයක් සහිත ඉතා පිරිසිදු ඉල්ලම් මිනිරන් සැපයීමට සමත්ය. එම මිනිරන් කුරු, කැට, පොකුරු සහ පතුරු ආදී වශයෙන් කැණීම් කරනු ලැබේ.ඉහල කාබන් ප්‍රතිශතයක් සහ අඩු භෂ්ම ප්‍රතිශතයක් ඇති ඉල්ලම් මිනිරන් සඳහා ලෝක  වෙළඳපොලේ සුවිශේෂී පිළිගැනීමක් පවතී.

### අපනයන වෙළඳපොළ

KGLL යනු අපනයන මූලික සමාගමක් වන අතර 2023/25 කාලය තුළ එහි ප්‍රධාන අපනයන රටවල් වූයේ ජපානය, චීනය සහ ඕස්ට්‍රේලියාවයි.

විදුලි වාහන සහ බලශක්ති ගබඩා බැටරි සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහා 2030 වන විට නව මිනිරන් පතල් 300 කට වඩා ඉදි කිරීමට අවශ්‍ය වනු ඇතැයි වෙළඳපොල විශ්ලේෂකයින් ඇස්තමේන්තු කර ඇත.

### 2025 සිට ඊළඟ වසර පහ සඳහා ස්වභාවික මිනිරන් සඳහා දැක්ම

ඉදිරි වසර පහ තුළ, ස්වාභාවික මිනිරන් වෙළඳපොළ සැලකිය යුතු වර්ධනයක් සඳහා සූදානම්ව සිටින අතර, එය ප්‍රධාන වශයෙන් පුළුල් වන විදුලි වාහන (EV) කර්මාන්තය සහ බලශක්ති ගබඩා විසඳුම් සඳහා නැඹුරු වීමේ දිශානතියක් පෙන්නුම් කරන අතර එමගින් මිනිරන් සඳහා ඉල්ලුමේ වැඩිවීමක් අපේක්ෂා කලහැක. කෙසේ වෙතත්, මෙම වර්ධනය සඳහා සැපයුම් ගතිකත්වය, භූ දේශපාලනික සාධක සහ වෙළඳපොළ යැපීම් සම්බන්ධ අභියෝග ද ඇත.

**මිනිරන් සඳහා ඇති වෙළෙඳපොල ඉල්ලුම**

ගෝලීය මිනිරන් වෙළඳපොළ 2025 සිට 2030 දක්වා 6.7% ක සංයුක්ත වාර්ෂික වර්ධන වේගයකින් (CAGR) වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, 2028 වන විට ඇස්තමේන්තුගත වටිනාකම ඩොලර් බිලියන 38 ක් පමණ වනු ඇත. මෙම වැඩිවීමට බොහෝ දුරට හේතු වී ඇත්තේ මිනිරන් ඇනෝඩ සහිත ලිතියම්-අයන බැටරි භාවිතා කරන EV වාහන භාවිතය ඉහළ යාමයි. සැලකිය යුතු ලෙස, බැටරි නිෂ්පාදනය සඳහා ස්වාභාවික මිනිරන් වලට ඇති ඉල්ලුම ඉදිරි වසර පහ තුළ තුන් ගුණයකින් පමණ වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. (statista.combatterymaterials.org)

**ගෝලීය මිනිරන් සැපයුම්**

චීනය වර්තමානයේ ගෝලීය මිනිරන් සැපයුම් දාමයේ ආධිපත්‍යය දරන අතර ස්වාභාවික හා කෘතිම මිනිරන් නිෂ්පාදනයෙන් සැලකිය යුතු කොටසක් සඳහා දායක වේ. 2024 දෙසැම්බර් මාසයේදී චීනය ඇතැම් මිනිරන් නිෂ්පාදන සඳහා අපනයන සීමාවන් ක්‍රියාත්මක කළ අතර එමඟින් ගෝලීය සැපයුම් ජාලයේ හිඟයක් පෙන්නුම් කිරිම නිසා ඉන් කනස්සල්ලට පත්වූ අනෙකුත් රටවල් විකල්ප ප්‍රභවයන් සෙවීමට පෙළඹුණි. මෙය විශේෂයෙන් උතුරු ඇමරිකාවේ සහ යුරෝපයේ දේශීය මිනිරන් නිෂ්පාදනය සහ සැකසුම් හැකියාවන් වර්ධනය කිරීම සඳහා උත්සාහයන් වේගවත් කර ඇත.

**වෙළඳපල අභියෝග**

ශුභවාදී ලෙස ඉල්ලුමේ ඉදිරි දැක්ම තිබියදීත්, මිනිරන් වෙළඳපොළ අභියෝග කිහිපයකට මුහුණ දෙයි.

**මිල අස්ථාවරත්වය:** විශේෂයෙන් චීනයේ නිෂ්පාදන ධාරිතාව වැඩිවීම මිල උච්චාවචනයන්ට හේතු වී තිබේ. නිදසුනක් වශයෙන්, මිල අඩු කෘතිම චීන මිනිරන් ගෝලීය වෙලෙඳපොළට ගලා ඒම නිසා ගුණාත්මක භාවයෙන් ඉහල ස්වාභාවික මිනිරන් මිලෙහි සැලකිය යුතු පහත වැටීම හේතුවෙන් ස්වාභාවික මිනිරන් අළෙවියෙන් වැඩි ලාභයක් අත්පත් කරගැනීමට නොහැකිවීම.


**භූ දේශපාලනික ආතතීන්:** අපනයන සීමා කිරීම් සහ වෙළඳ ප්‍රතිපත්ති, ගෝලීය සැපයුම් දාමයන්ට බලපෑම් ඇති කරන අතර, මිනිරන් වෙලෙඳපොලට පිවිසීමේ සීමාවන් ඇතිවන අතර ඇතම් මිලකරණයට ද බලපායි. චීනයේ මෑත කාලීන අපනයන පාලනයන් අනෙකුත් රටවලට ස්ථාවර මිනිරන් සැපයුම් සුරක්ෂිත කිරීමේ හදිසි අවශ්‍යතාව ඉහළ නංවා ඇත.

**පාරිසරික හා සමාජීය ගැටළු:** විශේෂයෙන් ප්‍රමාණවත් නියාමන රාමු නොමැති කලාපවල පතල් මෙහෙයුම්, පාරිසරික පරිහානියට හා සමාජ ගැටුම් වලට හේතු විය හැක. නිදසුනක් වශයෙන්, නැවත පදිංචි කිරීමේ ගැටළු සම්බන්ධයෙන් මොසැම්බික් රාජ්‍යයෙහි ප්‍රාදේශීය විරෝධතා හමුවේ පතල් කටයුතු නවතා දැමීම නිසා එය ගෝලීය සැපයුමට බලපෑම් ඇති කරන ලදී. (The Wall Street Journal)

**තාක්ෂණික නවෝත්පාදන:** සැපයුම් බාධක අවම කිරීම සඳහා පුනරාවර්තන තාක්ෂණයේ දියුණුව ශක්‍යතා විසඳුම් ලෙස මතු වෙමින් පවත යුරෝපීය ආරම්භක සමාගම් මිනිරන් ඇතුළු EV බැටරි, ප්‍රතිචක්‍රීයකරණයේ කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ඇත .2027 වන විට වාර්ෂිකව ප්‍රතිචක්‍රීකරණය කරන ලද මිනිරන් මෙට්‍රික් ටොන් 2,000ක් නිෂ්පාදනය කිරීම අරමුණු කරගනිමින්, භාවිතා කළ බැටරිවලින් මිනිරන් නැවත ලබා ගැනීමේ ක්‍රියාවලීන් සංවර්ධනය කරමින් සිටින අතර, එය EV වාහන 50,000කට ප්‍රමාණවත් වන බව පෙන්නුම් කර ඇත.


**කාර්ය සාධන විශ්ලේෂණය**

සමාගමේ කාර්ය සාධන විශ්ලේෂණය 2020 සිට 2025 දක්වා සමාගම විසින් ඉදිරිපත් කර ඇති දත්ත මත පදනම්ව සිදු කෙරේ.





ප්‍රස්තාරය 1

කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමෙහි (KGLL) 2020/21 සිට 2024/25 දක්වා කාලය තුළ නිෂ්පාදනය උච්චාවචනය වී ඇති බව ප්‍රස්තාරය 1 අනුව පෙන්නුම් කරයි.





ප්‍රස්තාරය 2

ප්‍රස්තාරය 2 ට අනුව, 2020/21 සිට 2023/24 දක්වා සමාගමේ මුළු නිෂ්පාදන පිරිවැය වැඩි වී ඇත. කෙසේ වෙතත්, 2024/25 මුළු නිෂ්පාදන පිරිවැය පෙර වසරට සාපේක්ෂව අඩු වී ඇත. ඉහළම නිෂ්පාදන පිරිවැය 2023/24 වර්ෂයේදී වාර්තා වී ඇත.




ප්‍රස්ථාරය 3


ප්‍රස්ථාරයට අනුව කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමෙහි (KGLL) හි විකුණුම් ප්‍රමාණය 2020/21 වර්ෂයේ සිට 2024/25 දක්වා ක්‍රමයෙන් අඩු වී ඇත.




| | 2020/21 | 2021/22 | 2022/23 | 2023/24 | 2024/25 |
|---|---|---|---|---|---|
| Sales Revenue | 126.14 | 123.42 | 179.52 | 128.55 | 146.96 |
| Cost of Sales | 78.35 | 76.11 | 75.9 | 61.26 | 60.6 |
| Gross Profit | 47.79 | 47.31 | 103.62 | 67.29 | 86.36 |

ප්‍රස්ථාරය 4


ප්‍රස්ථාරයට අනුව KGLL විකුණුම් ආදායම හා විකිණුම් පිරිවැය 2020/21 සිට 2024/25 දක්වා කාල සීමාව තුළ ප්‍රස්ථාරය 4 ට අනුව උච්චාවචනය වී ඇත. 2022/23 වර්ෂයේදී ඉහළම විකුණුම් ආදායම සහ ඉහළම දළ ලාභයක් වාර්තා කර ඇත.




| | 2020/21 | 2021/22 | 2022/23 | 2023/24 | 2024/25 |
|---|---|---|---|---|---|
| Recurent Expenditure | 113 | 114 | 122 | 104 | 123 |
| Salaries & Wages | 51 | 60 | 69 | 59 | 69 |
| Overtime & Other Allowances | 10 | 14 | 20 | 19 | 23 |

ප්‍රස්ථාරය 5

5 වන ප්‍රස්ථාරයට අනුව, 2020/21 වර්ෂයේ සිට 2024/25 දක්වා පුනරාවර්තන වියදම් වැටුප්, අතිකාල සහ අනෙකුත් දීමනා ද උච්චාවචනය වී ඇත. වැටුප් සහ වේතන, මුළු පුනරාවර්තන වියදම් වලින් 45% - 56% ක් නියෝජනය කරයි.




ප්‍රස්ථාරය 6

2020/21 සිට 2024/25 දක්වා වසරවලදී KGLL හි ලාභය උච්චාවචනය වන බව 6 වන ප්‍රස්ථාරයෙන් දැක්වේ. 2022/23 සිට සමාගම ලාභය රු. මිලියන 57.11 දක්වා වැඩි කර ගෙන ඇත. කෙසේ වෙතත්, ඉදිරි වසර දෙක තුළ ලාභය අඛණ්ඩව සැලකිය යුතු ලෙස අඩු විය. 2022/23 වර්ෂයේ රු. මිලියන 57 ක ඉහළම ලාභය 2021/22 වර්ෂයට සාපේක්ෂව ආසන්න වශයෙන් 5 ගුණයක වැඩිවීමකි.




7 වන ප්‍රස්ථාරය

7 වන ප්‍රස්ථාරයට අනුව, 2020 සිට 2025 දක්වා KGLL හි මුළු සේවකයින් සංඛ්‍යාව 120 සිට 105 දක්වා අඩු වී ඇත. වර්තමානයේ සමාගමේ මුළු සේවකයින් සංඛ්‍යාව 105 කි. කෙසේ වෙතත්, විශ්‍රාම යාම හේතුවෙන් මෙම සේවකයින් අඩු වී ඇති අතර නිෂ්පාදනය ඉහළ නැංවීමට මෙන්ම පතලේ සංවර්ධන කටයුතු පවත්වාගෙන යාමට නව සේවකයින් බඳවා ගත යුතුය. ඒ සඳහා දැනටමත් ක්‍රියාත්මක් වී ඇත.

**නිරීක්ෂණ සහ නිර්දේශ**

- ඉහළ කාබන් ස්වභාවික ස්ඵටිකරූපී නහර මිනිරන් සපයන එකම වාණිජ ප්‍රභවය ශ්‍රී ලංකාව වන අතර විශේෂයෙන් කහටගහ පතල 90% සිට 99% ට වඩා වැඩි කාබන් සංයුතියකින් යුත් ස්වාභාවික නහර මිනිරන් සම්පූර්ණයෙන්ම ස්ඵටිකීකරණය කළ ආකාරයෙන් කැණීමේ හැකියාව ඇත.

- අද්විතීය නිෂ්පාදන සැපයුම්කරුවෙකු ලෙස ලෝක වෙළඳපොලේ පිළිගැනීමේ ඔප්පු කළ කීර්තියක් ඇති කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හට ලෝක වෙළඳපොලට ප්‍රවිශ්ය වීමට විශාල අවස්ථාවක් තිබේ.

- සිලෝන් ග්‍රැෆයිට් සඳහා වන ගෝලීය පිළිගැනීමෙ වාසිය ප්‍රයෝජන ගනිමින්, නිෂ්පාදනය සහ අලෙවිය වැඩිදියුණු කළ හැකි අතර, එමඟින් වඩා හොඳ ලාභයක් ලැබෙනු ඇත.

- 2021 සිට 2025 දක්වා කාලය තුළ සමාගමේ කාර්ය සාධනය පෙන්නුම් කරන්නේ නිෂ්පාදනය සහ විකුණුම් යන දෙකෙහිම උච්චාවචනයක් සමග අඩුවීමක් බවයි.

- වාර්ෂික නිෂ්පාදනය සහ විකුණුම් පුරෝකථනය සමඟ සමස්ත උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම, සමාගමේ සමස්ථ කාර්ය සාධනය කෙරෙහි ධනාත්මක ලෙස බලපානු ඇති අතර එය එදිනෙදා හා අනාගත මෙහෙයුම් හා ව්‍යාපාර ක්‍රියාවලීන්හි ක්‍රියාකාරකම් සැලසුම් කිරීම පිළිබඳ හොඳ අවබෝධයක් ලබා ගැනීමට උපකාරී වනු ඇත.